# සාමාන්‍ය සමය තිස්වන සතිය

## සඳුදා

පළමුවන කියැවීම රෝම 8: 12–17

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

ඔබ ලබා ඇත්තේ "අබ්බා, පියාණෙනි" යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකමේ තත්ත්වයකි.

එබැවින් සහෝදරවරුනි, මාංශයට ගැතිව ජීවත් වීමට අප මාංශයට බැඳී නැත. ඔබ මාංශයට ගැතිව ජීවත් වන්නහු නම්, මරණයට පත් වනු ඇත. එහෙත් ආත්මයාණන් මගින් ඔබ මාංශික ක්‍රියා නසන්නහු නම්, ඔබ සැබැවින් ම ජීවත් වන්නහු ය. දේවාත්මයාණන් විසින් මග පෙන්වනු ලබන්නෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. මන්ද, ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන වහල් සේවයේ තත්ත්වය නොව, "අබ්බා පියාණෙනි" යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රභාවය ලැබීමේ තත්ත්වයකි. අපි දෙවියන් වහන්සේගේ දරුවන් බවට ශුද්ධාත්මයාණෝ ම අප ආත්මය හා එක්ව සාක්ෂි දරති. අපි දරුවෝ නම් උරුමක්කාරයෝද වම් හ. දෙවියන් වහන්සේගේ උරුමක්කාරයෝ ද ක්‍රිස්තුස් වහන්සේ හා සමග හවුල් උරුමක්කාරයෝ ද වම්හ. මන්ද, දැන් උන්වහන්සේගේ දුක්විඳීමේ පංගුකාරයන් වීමෙන්, අනාගතයේ දී උන්වහන්සේගේ මහිමයේ පංගුකාරයෝ වම්හ.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 68: 1, 3, 5–6, 19–20

පිළිතුර : අපගේ දෙවිඳාණෝ අප මුදන දෙවි සමිඳාණෝ වන සේක.

ගීය : දෙවිඳාණෝ නැගිට සතුරන් විසුරුවා හරින සේක.
එතුමන්ට වෛර කරන්නේ එතුමන් ඉදිරියෙන් පලා යන්නෝ ය.
එහෙත්, දැහැමියෝ දෙවිඳුන් අබිමුව ප්‍රීති ප්‍රමෝද වෙත්වා!
ප්‍රීතියෙන් කුල්මත් වී ගී ගයත්වා!

එතුමාණෝ අනාථයන්ගේ පියාණෝ ද
වැන්දඹුවන්ගේ ආරක්ෂකයාණෝ ද වන සේක.
සිය ශුද්ධ නිවාසයෙහි වසන එතුමාණෝ දෙවිඳාණෝ ය.
දෙවිඳාණෝ අනාථ වූවන්ට නිවෙස් තනා දෙන සේක.
සිරකරුවන්ට නිදහස දෙන සේක.

දවසින් දවස අපේ බර උසුලන සමිඳුන් හට පැසසුම් වේවා.
එතුමාණෝ අප ගළවන දෙවිඳාණෝ වන සේක.
අපේ දෙවිඳාණෝ, අපේ ගැළවුම්කාර දෙවිඳාණෝ වන සේක.
අප මරණින් මුදන දෙවි සමිඳාණෝ වන සේක.

සුපුවත් ජය නද ජුවාම් 17: 17

ආලේලූයා! ආලේලූයා!
"සත්‍ය නම් ඔබ වහන්සේගේ ධර්මය ය.
සත්‍යයෙහි අප කැප කළ මැනව" යි
ස්වාමීන් වහන්සේ යාච්ඤා කළ සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 13: 10-17

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ආබ්‍රහම්ගේ දියණියක වූ මේ ස්ත්‍රිය සබත් දිනයේ දී ඒ බන්ධනයෙන් මුදාලීම නුසුදුසු ද?

දෙවියන් වහන්සේ සබත් දිනෙක එක් ධර්ම ශාලාවක අනුශාසනා කරමින් සිටි සේක. එහි දස අට වසක් තිස්සේ අශුද්ධාත්මයක් නිසා දුර්වලකමින් පෙළුණු, කොයි අන්දමකින් වත් කෙළින් වෙන්නට බැරි ස්ත්‍රියක් වූවා ය. ජේසුස් වහන්සේ ඇ දැක කැඳවා, "ස්ත්‍රිය, ඔබේ දුර්වලකමින් ඔබ මිදුණෙහි ය" යි කියා ඇ පිට අත් තැබූ සේක. එකෙණෙහි ම ඇ කෙළින් සිට දෙවියන් වහන්සේට ප්‍රශංසා කළා ය. ජේසුස් වහන්සේ සබත් දිනයේ දී සුව කළ බැවින් ධර්ම ශාලා නායකයා කෝපව සමූහයා අමතා, "වැඩපළ සඳහා සදවසක් ඇත. සබත් දිනයේ නොව වෙන දවස්වල අවුත් සුවය ලබා ගන්නැ" යි ඔවුන්ට කීය.

ස්වාමීන් වහන්සේ ඔහුට උත්තර දෙමින්, "කෛරාටිකයෙනි, ඔබ හැම කෙනෙකු ම සබත් දිනයේ දී තමාගේ ගොනා හෝ කොටළුවා හෝ ගාලෙන් ලිහා වතුර දීමට ගෙන යනවා නොවේ ද? එසේ නම්, දස අට වසක් තිස්සේ සාතන් විසින් බඳිනු ලැබ සිටි, ආබ්‍රහම්ගේ දියණියක වූ මේ ස්ත්‍රිය ඒ බන්ධනයෙන් සබත් දිනයේ දී මුදන්නට යුතුව තිබුණා නොවේදැ" යි වදාළ සේක. මෙසේ වදාළ විට උන් වහන්සේගේ සියලු විරුද්ධවාදීහු ලජ්ජාවට පත් වූහ. මුළු සමූහයා ද උන් වහන්සේ කළ මහිමාන්විත ක්‍රියා සියල්ල ගැන අමන්දානන්දයට පත් වූහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.